**ශීර්ෂය 440 - මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 දේපල පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දේපල පිරියත හා උපකරණවල ආරම්භක ශේෂයට කාර්යාල උපකරණ, පරිගණක උපකරණ හා සන්නිවේදන උපකරණ සඳහා රු.1,719,689 ක් එකතු කර තිබු අතර එහි නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා එම වටිනාකම සෑදී ඇති අයිතමයන් හා වටිනාකම් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සඳහා වන මාර්ගෝපදේශයේ අංක 5 පරිදි මූල්‍ය ප්‍රකාශ සඳහා වූ ආදර්ශ ආකෘතිය යටතේ (ඒසීඒ-6) දක්වා ඇති පරිදි නව CIGAS වෙබ් යෙදුම මඟින් ජනනය කරන ලද මූල්‍ය නොවන වත්කම් වාර්තාව (SA 82) පමණක් අමුණා තිබිය යුතු බවට උපදෙස් ලබා දී ඇත. | දේපල පිරියත හා උපකරණවල වටිනාකම සෑදී ඇති ආකාරය පිළිබඳ විස්තරාත්මක ලේඛන පවත්වා ගත යුතුය. |

### 1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 842 අනුව ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගෙන යා යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන යනු ලබයි. | ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගත යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය. | හානි පිළිබඳ ලේඛනය පවත්වා ගෙන යනු ලබයි. | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 වියදම් කළමනාකරණය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය<br>------------------------ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>------------------------------------ | නිර්දේශය<br>------------ |
|---|---|---|
| (අ) වැඩසටහන් 1 හා වැඩසටහන් 2 යටතේ පුනරාවර්තන වියදම් සඳහා ඇස්තමේන්තුගත ශුද්ධ ප්‍රතිපාදනය රු.206,947,000 ක් වූ අතර ඉන් උපයෝජනය කර තිබුණේ රු.123,849,582 ක් පමණකි. මේ අනුව රු.83,097,418 ක පුනරාවර්තන වියදම් සඳහා වූ ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 40 ක් විය. ඒ අනුව පුනරාවර්තන වැය විෂයන් 15 ක සියයට 30 සිට සියයට 100 ක් දක්වා පරාසයක ඉතිරිවීම් විය. | Covid 19 තත්ත්වය හේතුවෙන් ආයතනවල ක්‍රියාකාරිකාරිත්වය අනපේක්ෂිත ලෙස මන්දගාමී තත්වයකට පත්වීම, කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම, අරපිරිමැස්මෙන් වියදම් සිදු කිරීම හා අමාත්‍ය මණ්ඩල තීරණ අනුව අත්‍යාවශ්‍යම වියදම් පමණක් දැරීමට ජාතික අයවැය දෙපාර්තමේන්තුව මඟින් උපදෙස් දීම ආදිය ඉතිරිවීම්වලට හේතු විය. | ලබාදුන් ප්‍රතිපාදන ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) වැඩසටහන් 1 හා 2 යටතේ ප්‍රාග්ධන වියදම් සඳහා අයවැය ඇස්තමේන්තුගත ශුද්ධ ප්‍රතිපාදනය රු.87,300,000 ක් වූ අතර තථ්‍ය වියදම රු.32,781,644 ක් විය. මේ අනුව රු.54,518,356 ක්වූ ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණු අතර එය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 62 ක් බව නිරීක්ෂණය විය. මුලධන වැය විෂයන් 4 ක සියයට 61 සිට සියයට 100 ක පරාසයක ඉතිරි වීම් විය. | -එම- | -එම- |
| (ඇ) "වෙනත්" වැය විෂයන් හා මුලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් - වාහන වැය විෂයට මු.රෙ.66 යටතේ රු.5,000,000 ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය තුල මාරුකර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානයට එම වැය විෂයයේ රු.4,728,542 ක් ඉතිරිව පැවතුණි. | අමාත්‍යවරයාගේ වාහනවල සිදුවූ අළුත්වැඩියා හේතුවෙන් රු.මිලියන 5 ක් මු.රෙ. 66 යටතේ මාරු කිරීමට සිදුවිය. අමාත්‍ය මණ්ඩල තීරණ අනුව අත්‍යාවශ්‍යම වියදම් පමණක් දැරීමට කටයුතු කිරීමට අයවැය දෙපාර්තමේන්තුව මඟින් ලබාදුන් උපදෙස් පරිදි කටයුතු කිරීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි විය. | අවශ්‍යතාවය නිසි පරිදි හඳුනා ගෙන මු.රෙ. යටතේ මාරු කිරීම් සිදුකල යුතුය. |

2.2 .නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2022 වර්ෂයේ සිට මෙම වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 ජනවාරි 24 දිනැති අංක 2018/02 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | ඇමුණුම 02 ආකෘතිය ප්‍රකාරව මානව සම්පත් සැලසුමක් සකස් කර නොතිබුණි. | මානව සම්පත් සැලැස්ම සකස් කරමින් පවතී. මූලික කටයුතු ආරම්භ කර ඇත. | -එම- |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශය යටතේ පවතින ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පිහිටුවීමේ පනත සංශෝධනය කිරීම සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතු බවට නීති කෙටුම්පත් සම්පාදක විසින් 2020 වර්ෂයේ දැනුම් දී තිබු අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය මත, මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයට අදාළව ලෝක වෙළෙඳපොළෙහි පැවති ප්‍රවණතා අඩුවීම හේතුවෙන් කෙටුම්පත් කර තිබූ පනත නැවත සංශෝධනය කිරීමට සිදුවිය. ඒ අනුව 2021 නොවැම්බර් 05 දින පනත සංශෝධනය කිරීමට අදාල අමාත්‍ය මණ්ඩල සංදේශය කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කර ඇත. අමාත්‍ය මණ්ඩල කාර්යාල ඉල්ලීමකට අනුව එයට අදාලව සංකල්ප පත්‍රිකාවක්ද සකස් කරමින් පවතී. | ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත කඩිනමින් සංශෝධනය කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රත්‍රන් ආනයනය කිරීමේදී ආනයන පාලන බලපත්‍රයක් ලබාගත යුතු බවත් ඒ සඳහා **CIF** වටිනාකම මත සියයට 0.4 ක ආනයන පාලන බලපත්‍ර ගාස්තුවක් ගෙවීමටත් නියම කර තිබුණි. මේ නිසා ස්වර්ණාභරණ ව්‍යාපාරිකයන්ට සිදුවන අපහසුතා පිළිබඳව එම ව්‍යාපාරිකයන්ගේ දැනුම් දීම මත අමාත්‍යාංශය මගින් එකී බලපත්‍ර ගාස්තුව අහෝසි කිරීමට මුදල් අමාත්‍යාංශය වෙත යෝජනා කර තිබුණි. එමෙන්ම විදේශ රටවලින් ආනයනය කරන රත්‍රන් ප්‍රමාණයට සාපේක්ෂව ආභරණ අපනයනය වීමත් සිදුවී නොමැති බවත් එමගින් රට තුලට විදේශ විනිමය වැඩිවීමක් සිදුවී නොමැති බවට ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් වාර්තා කර තිබුණි. | පවතින විදේශ විනිමය අර්බුදය හේතුවෙන් 2021 වර්ෂයේදී ආනයන අපනයන පාලක විසින්, රත්‍රං ආනයනය සඳහා ආනයන පාලන බලපත්‍රක් ලබාගත යුතු බවටත්, ඒ සඳහා CIF වටිනාකම මත 0.4% ක ආනයන පාලන බලපත්‍ර ගාස්තු ගෙවීමට නියම කර තිබුණි.<br>ප්‍රධාන වශයෙන් ලංකාවට රත්‍රං ආනයනය කරන්නේ අගය එකතුකර අපනයනය කිරීම සඳහා සහ ලංකාවේ පරිභෝජනය කිරීම සඳහා වේ. එබැවින්, ලංකාවට ආනයනය කරන සියලුම රත්‍රං අපනයනය කිරීමක් සිදු නොවේ.<br>ඒ අනුව 2018 වර්ෂය සහ 2021 වර්ෂයේ රත්‍රං සඳහා බදු පනවා ඇත්තේ ලංකාවේ රත්‍රං පරිභෝජනය අඩු කිරීමේ අරමුණින් හෝ ලාංකීය ස්වර්ණාභරණ ශිල්පීන් අධෛර්යමත් කිරීමේ අරමුණින් නොවන බවත් පෙන්වා දෙමි. | රත්‍රන් ආභරණ අපනයනය තුලින් විදේශ විනිමය උපයා ගැනීමට ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කල යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුල ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය මහජනතාව වෙත සේවා සැපයීමේදි හා මැණික් ගැරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමේදි ඇතිවන ගැටලු හා පරිසර විනාශයන් සම්බන්ධව මහජන පැමිණිලි 120 ක් ලැබී තිබුණි. එම මහජන පැමිණිලි පරීක්ෂා කර බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස අධිකාරිය වෙත යොමුකර තිබුණත් ඉන් පැමිණිලි 10 කට පමණක් අමාත්‍යාංශය වෙත පිළිතුරු ලබාදී තිබුණි. මේ සම්බන්ධව සොයා බලා අවශ්‍ය කටයුතු කිරීමට සහ ඒ පිළිබඳව වැඩිදුර විමර්ශනයක් කිරීමට අමාත්‍යාංශය පියවර ගෙන නොතිබුණි. | මෙම මහජන පැමිණිලි නිලධාරීන්ගේ/ආයතනවල අක්‍රමිකතා සම්බන්ධ පැමිණිලි, මැණික් ගැරීමේ බලපත්‍ර සම්බන්ධ පැමිණිලි, ආයතනික කටයුතුවලට අදාල ගැටලු හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රය ආශ්‍රිත ගැටලු යන විවිධ වර්ග වලට අයත් පැමිණිලි විය. එම පැමිණිලි සම්බන්ධයෙන් අධිකාරියේ අදාල ප්‍රාදේශීය කාර්යාල මගින් පරීක්ෂණ සිදු කර වාර්තා කරනු ලැබේ.<br>මෙම කාර්යය සඳහා සැලකිය යුතු කාලයක් ගතවන අතර දැනට මෙම පැමිණිලි අතරින් පැමිණිලි 43 ක් පිළිබඳව පරීක්ෂා කර බලා අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කර අවසන්කොට ඇත. | මහජන පැමිණිලි පරීක්ෂා කර කඩිනමින් විසඳුම් ලබා දිය යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) මැණික් ඇතුළු වටිනාකම එකතු කිරීමකින් තොරව අපනයනය කරන ඛනිජ සම්පත් අපනයනය කිරීම සම්බන්ධව අමාත්‍යාංශය යටතේ පවතින ආයතන 2 හි පහත දැක්වෙන අඩුපාඩු තවදුරටත් පවතින බව නිරීක්ෂණය විය. | | |
| (i) දැනට ශ්‍රී ලංකාව තුල හමුවන මැණික් අගය එකතු කිරිමකින් තොරව කපා ඔපමට්ටම් කර හෝ රළු මැණික් ලෙස විදේශවලට අපනයනය කරමින් පවතී. 2015-2021 සැප්තැම්බර් දක්වා කාලය තුල අගය එකතු කිරිමකින් තොරව එලෙස අපනයනය කල මැණික්වල වටිනාකම රු.මි. 127,635 ක් විය. | ශ්‍රී ලංකාව තුළ හමුවන මැණික් ගල් අතරින් අගය එකතු කිරීමකින් තොරව විදේශවලට අපනයනය කිරීමට අවසර දෙනු ලබන්නේ ලංකාව තුළ එම මැණික් සඳහා අගය එකතු කිරීමක් සිදු කිරීමට තාක්ෂණික පහසුකම් නොමැති අවස්ථාවලදී පමණි. එසේ අගය එකතු කිරීමක් කළ නොහැකි මැණික් ගල් අපනයනය කිරීමේදී එම මැණික්වල වටිනාකමින් (ඩොලර් අගයෙන්) 25%ක් සේවා ගාස්තු ලෙස මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට ගෙවිය යුතු වේ. | වටිනාකම එකතු කර ඉහල අපනයන ආදායමක් ලබාගත හැකි නිෂ්පාදන බවට පත්කර ගැනීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |
| (ii) අඩු වටිනාකමකින් යුතු මැණික් ගල්වල වර්ණය හා පැහැදිලි බව වැඩි කිරිම සඳහා පසුගිය කාලය තුල නිසි වැඩපිළිවෙලක් නොවීම හේතුවෙන් එම ගල් අඩු වටිනාකමක් සහිතව අපනයනය කර තිබුණි. මේ සඳහා ජාතික විද්‍යා පදනමේ මුල්‍යාධාර මත මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය විසින් පර්යේෂණයක් සිදුකර එහි වාර්තාව 2021 මැයි මස ලබා දී තිබු අතර ඒ පිළිබඳව අවධානය යොමුකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අඩු වටිනාකමකින් යුතු මැණික් ගල්වල වර්ණය හා පැහැදිලි බව වැඩිකිරීමේ තාක්ෂණය අතින් ලොව අනෙකුත් රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාව ඉදිරියෙන්ම සිටින අතර පෞද්ගලික ව්‍යාපාරිකයින් ගුරු මුෂ්ටිය තබා ගෙන මෙම කාර්යය සිදු කරනු ලැබේ. තවද මෙයට අදාළව නිරන්තරයෙන්ම වැඩිදුර පරීක්ෂණද සිදු කරනු ලැබේ. එසේ කරනු ලබන පරීක්ෂණ සාර්ථක වීමට සැළකිය යුතු කාලයක් ගතවේ.<br><br>තවද රජයට මේ සඳහා යෙදවිය හැකි වන සම්පත් ප්‍රමාණය සීමා සහිත වන බැවින් මෙම කාර්යය සඳහා සබරගමුව විශ්වවිද්‍යාලය සමග මැණික් ව්‍යාපාරික ප්‍රජාව සම්බන්ධ කරගනිමින් මැණික් වර්ණ ගැන්වීමට අවශ්‍ය පරීක්ෂණ කටයුතු කිරීම සඳහා පහසුකම් සලසා ඇත. | අඩු වටිනාකමකින් යුතු මැණික් ගල්වල වර්ණය හා පැහැදිලි බව වැඩි කිරීම සඳහා නිසි වැඩපිළිවෙලක් සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | (iii) අගය එකතු කිරීමකින් තොරව සිදුකරන ගෙවුඩ අපනයනය නවත්වා ඇති බවට අමාත්‍යාංශයේ සෞභාග්‍යයේ දැක්ම පිළිබඳ ප්‍රගතිය වාර්තාවේ දක්වා තිබුණි. එහෙත් 2015 - 2021 සැප්තැම්බර් කාල පරිච්ඡේදය තුළ ගෙවුඩ අපනයනය කිරීම මගින් රු.මි. 306 ක ආදායම් උපයා තිබුණි. | තාක්ෂණික හේතූන් මත මෙරටදී තාපකරණය කොට කපා ඔප දමා අගය එකතු කිරීමට නොහැකි ගෙවුඩ, කට්ට (Geuda, Katta), ඔට්ටු (Ottu Young) වැනි ගුණාත්මකභාවයෙන් අඩු කුඩා මැණික් ගල් අපනයනය කිරීමට ඉඩ සලසා දී ඇත. එමගින් රටට යම් විදේශ විනිමය ප්‍රමාණයක් උපයා දීමට හැකිවී ඇත. | අගය එකතු කර ගෙවුඩ අපනයනය කිරීමේ වැඩ පිළිවෙලක් සකස් කළ යුතුය. |
| | (iv) ගෙවුඩ පිළිස්සීම සඳහා මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය 2013 වර්ෂයේ රු.10,977,344 ක වටිනාකමට මිලදීගත් උදුනක් වර්ෂ 6 ක කාලයක් නිෂ්කාර්යව පැවතුණි. 2020 -2021 කාලය තුළ රු.3,953,540 ක මුදලක් දරා මෙම උදුනට අමතර කොටස් සහ විදුලි පරිපථ යොදා වැඩිදියුණු කිරීම් කර තිබුණි. 2020 – 2021 කාල පරිච්ඡේදය තුළ දින 14 ක කාලයක් පමණක් පර්යේෂණ ධාවන වාර 5 කට යන්ත්‍රය භාවිතා කර තිබුණි. | ගෙවුඩ පිළිස්සීම සඳහා වන විදුලි උදුනෙහි සිදු කළ යුතු අලුත්වැඩියාවන් කඩිනම් කිරීමට අවශ්‍ය කටයුතු කරන ලදී. ඒ සඳහා අවශ්‍ය අමතර කොටස් H.S කේත අංක යටතේ මෙරටට ආනයනය කර ලබා ගත යුතුව තිබුණි. එහෙත් එවකට එම කේත අංක යටතේ ගෙන්වන අයිතම ආනයනය අත්හිටුවා තිබීම නිසා හා දින 90ක ණය පදනම මත පමණක් ආනයනයට ඉඩ දී තිබීම නිසා අවශ්‍ය අමතර කොටස් ගෙන්වා විදුලි උදුන අලුත්වැඩියා කිරීමට සැලකිය යුතු කාලයක් ගත විය. | අපේක්ෂිත කාර්යයන් ඉටු කර ගැනීම සඳහා මෙම උදුන කාර්යක්ෂමව භාවිතා කළ යුතුය. |
| (ඉ) | භූගතව ඇතැයි සැලකෙන මැණික් සම්පත් නූතන අධි තාක්ෂණය භාවිතයෙන් ගවේෂණය කර රටේ නිෂ්පාදන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට යොදා ගැනීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය යටතේ පවතින මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය විසින් ශ්‍රී ලංකාවේ මැණික් නිධි ගවේෂණය කිරීම හා තක්සේරු කිරීම සම්බන්ධව සිදුකරන ව්‍යාපෘති මගින් ලංකාවේ මැණික් නිධි පිහිටි ප්‍රදේශ හඳුනාගෙන සිතියම් ගත කිරීම හා අවසාන වාර්තා නිකුත් කරමින් පැවතුණි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදි මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය හා මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය අතර නිසි සම්බන්ධීකරණයක් නොමැතිව මෙම | එකඟ වෙමි.<br>මේ වනවිට ආයතන දෙක අතර සම්බන්ධීකරණය සඳහා කටයුතු කර ඇත. | අමාත්‍යාංශයේ අරමුණු ඵලදායි ලෙස ඉටු කර ගැනීම සඳහා අමාත්‍යාංශය යටතේ පවතින ආයතන 2 අතර නිසි සම්බන්ධීකරණයක් පවත්වා ගත යුතුය. |

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම නිසා ව්‍යාපෘතියෙන් ලැබෙන ප්‍රතිඵල අඩු තත්ත්වයක පවතින බව නිරීක්ෂණය විය.

## 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අමාත්‍යාංශයට අයත් නොවන ගොඩනැගිල්ලක අමාත්‍යාංශය පවත්වා ගෙන ගොස් තිබු අතර රාජ්‍ය අමාත්‍යවරයාගේ කාර්යාලය නවීකරණය කිරීම සඳහා රු.12,107,471 ක් වැයකර තිබුණි. මේ අනුව අමාත්‍යාංශයට අයත් නොවන ගොඩනැගිල්ල නවීකරණයට වැයකල මුදල් අදාල ආයතනයට අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අමාත්‍යාංශයේ වියදමෙන් අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය දන්වා තිබුණි. | අදාල අමාත්‍යාංශයෙන් වැයකල මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) වෙනත් ආයතන සතු වාහන 5 ක් විධිමත්ව පවරා ගැනීමකින් තොරව අමාත්‍යාංශය භාවිතා කරන බව නිරීක්ෂණය විය. | පවරා ගැනිමට කටයුතු කරනු ලබයි. | විධිමත්ව පවරා ගැනිමට කටයුතු කළ යුතුය. |

## 3.3 පාඩු හා හානි

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මු.රෙ.104(4) ප්‍රකාරව අලාභ හානි සිදු වු දිනයේ සිට තුන් මසක් ඇතුළත දී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුල සිදුවු වාහන අනතුරු 3 ක් සම්බන්ධයෙන් 2022 මැයි 25 දින වන විටත් එසේ කටයුතු කර නොතිබුණි. | වාහනයේ අනතුර පිළිබඳව මු.රෙ. 104(4) පරීක්ෂණ කමිටුව පත් කර ඇති අතර එම පරීක්ෂණ වාර්තාව කඩිනමින් ලබා දීමට කටයුතු කරන ලෙස 2022 මැයි 20 දිනැති ලිපියෙන් සිහි කැඳවීම් කර ඇත. එම වාර්තාව ලැබුණු වහාම ඉදිරි කටයුතු සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | මු.රෙ.104(4) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**4. මානව සම්පත් කළමනාකරණය**

අනුමත කාර්ය මණ්ඩලය සහ තථ්‍ය කාර්ය මණ්ඩලය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අනුමත කාර්ය මණ්ඩලය 40 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 11 ක් විය. ඒ අනුව පුරප්පාඩු සංඛ්‍යාව 29 ක් විය. | තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කරන ලෙස ඉල්ලා ඇත. | සේවා අවශ්‍යතා සැලකිල්ලට ගෙන අනුමත කාර්ය මණ්ඩලවල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අදාල කටයුතු සිදුකල යුතුය. |